008

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

### 8 - ශ්‍රේණිය

### සිංහල භාෂාව හා සාහිත්‍යය

නම/විභාග අංකය :- ..........................................................................  කාලය: පැය 02යි.

## <u>I කොටස</u>

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- I කොටසේ ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයා, II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාර දෙන්න.

- පහත සඳහන් ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කිරීමට සුදුසු පදය තෝරා ලියන්න.

(01) ඇටි කෙහෙල් කාපු ...................................... වගෙයි.
(1) ලේනා  (2) ගිරවා  (3) උගුඩුවා  (4) මයිනා

(02) දන ගියොත් ...................................... නොදන ගියොත් අතරමග
(1) කතරගම  (2) නුවර  (3) ගෙදර  (4) විහාරයට

- ඉරි ඇඳි පදයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

(03) තරුණ පිරිස කැලය <u>ඉදවනත් කරමින්</u> පොරුන් අල්ලා ගත්හ.
(1) කැලය වට කොට  (2) මුර කොට
(3) කැලය පීරා පරීක්ෂා කරමින්  (4) ගස් උඩට නැග

- නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.

(04) (1) ඖෂධ  (2) කනිෂ්ඨ  (3) පිළියම්  (4) විශිෂ්ඨ

(05) (1) ගණකාධිකාරි  (2) පරිගණකය  (3) ලක්ෂණ  (4) නිෂ්ඵල

(06) අකාරාදි පිළිවෙළ නිවැරදිව දක්වා ඇති පද පේළිය වන්නේ,
(1) ඇතා , කොටියා , බල්ලා , හාවා  (2) රෝස , ඉද්ද , සමන්රු , දාස්
(3) අම්මා , තාත්තා , මල්ලි , නංගී  (4) මාතර , ගාල්ල , අම්පාර , බදුල්ල

(07) 'ගොඩැල්ලේ තරම දනගෙන ළිඳ <u>කපනු</u>' මෙහි ඉරි ඇඳි පදය
(1) අවසාන ක්‍රියාවකි.  (2) පූර්ව ක්‍රියාවකි.
(3) ආශිර්වාද ක්‍රියාවකි.  (4) විධි ක්‍රියාවකි.

(08) 'දද' යන පදයට බහු අර්ථ පදයක් නොවන්නේ,
(1) කොඩි  (2) මෝච  (3) ලෝකය  (4) කුරුල්ලා

(09) "ශ්වේත" යන පදයට සමාන අර්ථයක් නොදෙන පදය

(1) රතු (2) ධවල (3) සුදු (4) සෙළ

(10) මුලින් දී ඇති පදයේ අනුක්ත පදය නිවැරදිව යෙදී ඇති පද පේළිය වන්නේ.

(1) සංස්ථාවක් - සංස්ථාව (2) මිනිසෙක් - මිනිසා

(3) මැණිකෙක් - මැණිකන් (4) මවුලු - මවුලු

(11) මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් දෙන පදය වන්නේ.

සමූල - (1) සංඝටායම (2) සේවල

(3) සාමූහික (4) තෙකටෙන්

(12) අම්මා <u>ශිෂ්‍යත්ව</u> විභාගයට යන නංගිට <u>කිරිබත්</u> කැවුවා ය. මෙහි ඉරි ඇඳි පද

(1) තද්ධිත නාම සමාස නාම වේ. (2) තද්ධිත නාම හා කෘදන්ත නාම වේ.

(3) ජාති නාම හා ද්‍රව්‍ය නාම වේ. (4) ක්‍රියා නාම හා ගුණ නාම වේ.

(13) "මනා සේ රැක ගැනීම" යන්නට යෙදිය හැකි තනි පදය වන්නේ.

(1) නිරීක්ෂණය (2) පරිපාව (3) ගවේෂණය (4) සංරක්ෂණය

(14) අර්ථයෙන් සමීප යුගල පදයක් වන්නේ.

(1) සතුටුසාමීචි (2) ලච්චලොච්ච (3) මුදල්හදල් (4) පුද්දමිද්ද

- 15 සිට 17 දක්වා ප්‍රශ්න සඳහා හිස්තැනට ගැළපෙන පදය තෝරා ලියන්න.

(15) අම්මා උදෑසනින් අවදි වී කිරිබත් ..................................................

(1) පිසුවා ය. (2) පිසුවේය. (3) පිසූහ. (4) පිසින්නෝ ය.

(16) තාරකාවෝ අහසේ ..................................................

(1) බබලයි. (2) බැබලේ. (3) බබලති. (4) බැබළෙන්නිය.

(17) තොපි දිනපතා පාසල් ..................................................

(1) යති (2) යන්නෙහි (3) යන්නෙහු (4) යයි.

(18) නිවැරදිව විරාම ලකුණු යොදා ඇති පිළිතුර තෝරන්න.

(1) "විදානෙ රාලහාමි පැමිණිලා ද?"

(2) ඔව්. ඔව්. හොඳට අහගෙන ඉඳී.

(3) චන්දනා නාඩගමේ නායකයා ගමේ ගුරා ය.

(4) දරුවනි. රුපියල් 50ක් ඔවුන් අතර 2, 3 අනුපාතයට බෙදන්න.

(19) කුරුලු මී හඬට වශී වූ මම වනය පුරා <u>සතුටින්</u> ඇවිද්දෙමි. මෙම වාක්‍යයේ ඉරි ඇඳි පදය,

(1) නාම විශේෂණ පදයකි. (2) ක්‍රියා විශේෂණ පදයකි.

(3) ක්‍රියා නාම පදයකි. (4) තද්ධිත නාම පදයකි.

(20) මහප්‍රාණ අක්ෂර පමණක් යෙදී ඇති පද පේළිය වන්නේ.

(1) ඝ, ඨ, ධ, ඤ (2) ඤ, ඡ, ඵ, බ (3) ඡ, ඪ, ධ, ණ (4) ඨ, ඵ, ඪ, ඣ

(ලකුණු 2 × 20 = 40)

(04) පහත සඳහන් ප්‍රශ්නවලින් එකක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

(i) ශ්‍රී ලංකාවේ පාසල් දරුවන් තුළ බෝ නොවන රෝග ශීඝ්‍ර ලෙස වැඩි වෙමින් පවතී. මෙයට හේතු ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය දක්වන්නේ ක්ෂණික ආහාර භාවිතය, ව්‍යායාම නොමැතිවීම, මානසික සමබර බව නොමැති වීම බව ය. මේ පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීමට සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න. ඔබ පාසල් සෞඛ්‍යදාන කමිටුවේ ලේකම් සහන් අබේසුන්දර යයි සිතන්න. (ලකුණු 10)

නැතහොත්

(ii) කුරුපිටිගම කුරුලුබැද්ද වනෝද්‍යානයේ අනවසර ලෙස වටිනා දැව කපා ඉවත් කර ගැනීමක් සිදුවෙමින් පවතී. මේ ගැන ප්‍රදේශයේ අධවි වන නිලධාරීතුමාට දන්වමින් පැවෙන රාජකාරි ලිපිය සකස් කරන්න. ඔබ, එම ප්‍රදේශයේ සොවන සමාජයේ ලේකම් යයි සිතන්න. (ලකුණු 10)

(05) පෙළ පොතේ උද්ධෘත ඇසුරින් අසා ඇති පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) "සමන් පිච්ච මල් ඉහිරුණු
නිල් තණකොළ පිට්ටනියක්..."

(අ) ඉහත පද්‍ය කොටස ඇතුළත් ඔබට නියමිත පාඩම කුමක් ද?

(ආ) එම පැදි පෙළේ රචකයා නම් කරන්න.

(ii) අත්වැල් පර වැඩ සමව සිතන්නේ
උමන් සිත සව් සත කෙරෙහි කරන්නේ
..............................................................
..............................................................

ඉහත කවියේ ඉතිරි පදපදය සම්පූර්ණ කරන්න.

(iii) "මං කිව්වෙ, මං කිව්වෙ සුනා කියන්න වගේ මූ ඇවිත් තියෙන්නෙ නම් ලොකු මගෝඩියකට බව."

(අ) ඉහත සඳහන් ප්‍රකාශය කළේ කවු ද?

(ආ) එම ප්‍රකාශය අසා සිටියේ කවරෙක් ද?

(iv) පහත සඳහන් සාහිත්‍ය නිර්මාණවල නිර්මාණකරුවන් නම් කරන්න.

(අ) මනමේ නාට්‍යය -

(ආ) ලෝවැඩ සඟරාව -

(v) (අ) 'වැසි වසිනා අහස අපි' ගීතය රචනා කළේ කවුරුන් ද?

(ආ) එම ගීතය ගායනා කරන්නේ කවුරුන් විසින් ද? (ලකුණු 2x5= 10)

## II කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(01) පාසල් පාදක ඇගයීමක් ලෙස 'භිත්ති පුවත්පතක්' සැකසීමට ඔබ කණ්ඩායමට පැවරුණේ යැයි සිතන්න.

(i) භිත්ති පුවත්පත සැකසීම සඳහා ගුරුභවතාගෙන් ඔබට ලැබුණු උපදෙස් දෙකක් ලියන්න.

(ii) මෙම නිර්මාණය සඳහා ඔබ යොදූ නම කුමක් ද?

(iii) මෙම ක්‍රියාකාරකමේ දී ඔබ මුහුණ දුන් ගැටලු දෙකක් දක්වන්න.

(iv) එම ගැටලු සඳහා විසඳුම් ලබා ගත් ආකාරය ලියන්න.

(v) මෙම ක්‍රියාකාරකමෙන් ඔබ ලැබූ අත්දැකීම් දෙකක් ලියන්න.

(ලකුණු 2×5= 10)

(02) පහත මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150කට නොඅඩු රචනාවක් ලියන්න.

(i) මා දුටු මහගමසේකර ගීත රචකයාණෝ

(ii) සුවබර දිවියකට දේශීය ආහාර

(iii) මා සළින් පිළිදෙතු වුවහොත්

(iv) ලෝකයේ උතුම් රට ශ්‍රී ලංකාවයි.

(v) වන සම්පත සුරකිමු.

(ලකුණු 20)

(03) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සන්නිවේදනය යන වචනය අද බොහෝ විට අසන්නට ලැබෙන්නකි. එහි අර්ථය පණිවුඩ හුවමාරුයි. මේ වන විට මුළු ලෝකය ම එක ම සන්නිවේදන ජාලයකින් බැඳී ඇත. ඒ නිසා ලොව ඕනෑම සිදුවීමක් ඒ මොහොතේ ම රූපවාහිනිය හෝ අන්තර්ජාලය ඔස්සේ සජීවී ව නැරඹීමේ හැකියාව අපට ලැබී තිබේ. එමෙන් ම සැතපුම් දහස් ගණනක් දුර වසන හිත මිතුරන් සමග පණිවිඩ හුවමාරු කර ගැනීමට ද අද ගත වන්නේ ඉතා සුළු නිමේෂයකි.

'ලෝකය වටා සමපාද ත්‍රිකෝණයක් හි හා භූස්ථාවර කෘත්‍රිම චන්ද්‍රිකා තුනක් ස්ථාන ගත කළ හැකි ය. එමගින් මුළු ලොවට ම එකම තැනකින් නිකුත් වන පණිවුඩ සංඥා ග්‍රහණය කර ගත හැකි වන්නේ ය.' මේ අදහස ඉදිරිපත් කළේ ආතර් සී ක්ලාක් මහතා ය. එතුමා සම්මාන පුරවැසියකු වශයෙන් අපේ රටේ පදිංචි වී සිටීම ශ්‍රී ලාංකිකයන් වශයෙන් අපට ආඩම්බරයකි.

(i) ඡේදයේ සඳහන් පරිදි සන්නිවේදනය යනු කුමක් ද?

(ii) සිදුවීමක් ඒ මොහොතේම සජීවීව රූපවාහිනිය හෝ අන්තර්ජාලය ඔස්සේ අපට නැරඹීමට හැකිව ඇත්තේ කුමක් නිසා ද?

(iii) පණිවුඩ සංඥා ග්‍රහණය කරගත හැකි ආකාරය ඉදිරිපත් කළේ කවරෙක් ද?

(iv) කෘත්‍රිම චන්ද්‍රිකා තුනක් ස්ථාන ගත කළ හැකි ස්ථාන මොනවා ද?

(v) සමාන පද ලියන්න.

(අ) නිමේෂයකි (ආ) සංඥා

(ලකුණු 2×5= 10)